# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1769/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 28/11/2024 පැය 0910

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධව**

**01. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.11.26 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මීගොඩ පොලිස් වසමේ හොරගල ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 57 ග්‍රෑම් 139 ක් හා හෙරොයින් කිලෝ 29 ග්‍රෑම් 158 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකරුවෙකු විද්‍යුත් තරාදියක්, ජංගම දුරකථනයක් හා ලොරි රථයක් සමඟ** අත්අඩංගුවට ගෙන මීගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන තලවතුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.11.26 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මොරගහහේන පොලිස් වසමේ මිල්ලෑව ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 406 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මොරගහහේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන මිල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුර.**

2024.11.26 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මාවනැල්ල පොලිස් වසමේ ඉඳගොල්ල රබර් වතු යාය ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 21ක්, ගෝඩා ලීටර් 360 ක් , ගෑස් සිලින්ඩර්යක්, තඹ දඟරයක් හා යකඩ බැරල් 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගාලදිවුල්වැව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වූ කන්දෙවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ. මාවනැල්ල** පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. ගංජා පැල සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.11.27 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කතරගම පොලිස් වසමේ යාල රක්ෂිතයේ වෙහෙරගල ප්‍රදේශයේ වැටලීමක් **වගා කර තිබූ ගංජා පැල 70,950ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන කතරගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 52 ක් වූ ඇඹිලිපිටිය හා මැදිරිගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** කතරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**